**අගලවත්ත ප්‍රාදේශීය සභාව**

**-------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**-------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අගලවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

ගිණුම්කරණ අඩුපාඩු

-----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට රු.42,900 ක් වූ කර්මාන්ත තොගය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | 2020 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ii) | ප්‍රාග්ධන වැය රු.2,321,687 ක් පුනරාවර්තන වැය යටතේ දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | 2021 අයවැයෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ රු.954,085 ක් වූ ගොඩනැගිලි ඉදිකිරීම් අත්හැරී තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | 2020 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (iv) | ස්ථාවර වත්කම් ලේඛනයේ තිබුණු වටිනාකම රු.4,785,000 ක් වූ මෝටර්රථ හා කරත්ත 07 ක් හා රු.180,000 ක් වූ මල්ටි චොපර් යන්ත්‍රය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | 2020 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (v) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.8,000,000 ක් වුවත් , මූල්‍ය ප්‍රකාශනවල රු.6,096,390 ක් වශයෙන් දැක්වීම හේතුවෙන් රු.1,903,610 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | 2020 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

--------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21 වගන්තිය | - | සභාව සතු සමස්ථ මාර්ග ප්‍රමාණය ග්‍රාම සේවා වසම් අනුව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | සභාව සතු සමස්ථ මාර්ග ප්‍රමාණය ග්‍රාම සේවා වසම් අනුව හඳුනාගත යුතුය. | සභාව සතු මාර්ග හඳුනාගෙන ඉන්වෙන්ට්‍රිගත කර ඇති බව දන්වමි. |
| (ආ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය | | සමාලෝචිත වර්ෂයේ පවත්වාගෙන ගොස් තිබූ කර්මාන්ත 18 වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. | අදාල කටයුතු මේ වන විට සිදු කර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.3,173,629 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,635,243 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,227,085 | 4,310,090 | 3,674,500 | 635,590 | 3,232,085 | 4,050,186 | 3,012,862 | 1,037,324 |
| (ii) | කුලී | 2,320,000 | 2,060,372 | 1,817,659 | 242,713 | 8,647,000 | 3,763,782 | 3,326,869 | 436,912 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 320,000 | 337,150 | 335,150 | 2,000 | 352,500 | 313,300 | 313,300 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,700,000 | 3,052,600 | 3,034,725 | 17,875 | 10,549,000 | 17,751,005 | 11,331,388 | 14,719,617 |
| | | 7,565,085 | 9,760,212 | 8,862,034 | 898,178 | 22,780,585 | 25,878,273 | 17,984,419 | 16,193,853 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.618,438 ක් හා මුද්දර ගාස්තු රු.8,000,000 ක් විය. | අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | උසාවි දඩ අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව හා මුද්දර ගාස්තු උප ලේඛන පරික්ෂා කරමින් පවතින බව දන්වමි. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතුරු ව්‍යවස්ථා<br>ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 05 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා ගැනිමට කටයුතු කළ යුතුය. | ප්‍රධාන කාරණා 14 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන ගැසට් පත්‍රය මගින් පළකර ක්‍රියාත්මක කරන බව දන්වමි. |
| (ආ) ක්‍රියාකාරි සැලස්ම<br>2019 වර්ෂයේ සභා කර්මාන්ත හා මන්ත්‍රී යෝජනා සඳහා අයවැය යටතේ රු.මි. 4 ක ප්‍රතිපාදනයන් වෙන් කලද, ක්‍රියාකාරි සැලැස්ම තුල එම ව්‍යාපෘති හඳුනාගෙන නොතිබුණි. | අයවැය ලේඛනයට අනුව ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරිමට අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| වසර 05 ක කාල සීමාව වෙනුවෙන් සකස් කර තිබුණු තිරසර සංවර්ධන සැලැස්මේ හදුනාගත් අරමුණු 11 ක් වෙනුවෙන් ක්‍රියාකාරකම් 16 ක් ඇතුලත් කර තිබුණ ද, එම හදුනාගත් අරමුණු අතරින් අරමුණු 04 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හදුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 හා 2018 වර්ෂ වලට අදාල රු.140,001 ක් වු ටෙන්ඩර් තැන්පතු නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | තැන්පතු ආදායමට ගැනීමට හෝ නිදහස් කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසමක් සඳහා එක් ප්‍රජා මණ්ඩලය බැගින් පිහිටුවිය යුතු වුවත් අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ග්‍රාම නිලධාරි වසම් 34 ක් සඳහා ප්‍රජා මණ්ඩල 19 ක් පිහිටුවා නොතිබුණි. | ග්‍රාම සේවා වසම් අනුව ප්‍රජා මණ්ඩල පිහිටුවිය යුතුය. | ජනතා ඉල්ලීම මත ඉදිරියේදී ප්‍රජා මණ්ඩල පිහිටුවන බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු<br>ආදායම් පරික්ෂක තනතුරක, බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු දෙකක , වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 03 ක හා සෞඛ්‍ය කම්කරු තනතුරු 02 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පුරවා ගැනිමට අවශ්‍ය කටයුතු කල යුතුය. | අවශ්‍ය කටයුතු සඳහා පළාත් පාලන කොමසාරිස්ට යොමු කර ඇත. |
| (ආ) අයනොවන සේවක ණය<br>සේවය හැරගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 04 දෙනෙකුගෙන් 2016, 2017 හා 2018 වර්ෂ වලට අදාලව අයවිය යුතුව තිබුණු රු.65,562 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමකින් තොරව පෙර පාසැල් 08 කින් ළමයින් ඇතුලත් කිරිමේ ගාස්තු ලෙස ළමයින් 409 දෙනෙකු වෙනුවෙන් රු.440,500 අයකර තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමකින් තොරව පෙර පාසැල් ගාස්තු අය නොකල යුතුය. | පෙර පාසැල් සම්බන්ධ ලිපියේ සහතික කල පිටපතක් මුලා විගණන වාර්තාව සමඟ ඉදිරිපත් කරන බව දන්වමි. |
| (ආ) ග්‍රීන්පාර්ක් 01 අදියර- ඉඩම් වෙන්දේසියේ පොදු කොටසට උතුරින් පර්චස් 10 ක ඉඩමේ හිමිකරු විසින් සභාවට අයත් ඉඩමෙන් කොටසක් ද යා කරමින් ඉදිරිපස තාප්පයක් නිත්‍යානුකූල නොවන ලෙස ඉදිකිරීම් කර තිබුණ ද , එම අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් නිත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරිම් සම්බන්ධයෙන් නිත්‍යානුකූලව කටයුතු කල යුතුය. | අනවසර ඉදිකිරිම් සිදු නොකරන ලෙස දන්වා ඇති බව දන්වමි. |
| (ඇ) ඉහත බිම් කොටසට අදාල ඔප්පු හා පිඹුරුපත් වල මුල් පිටපත් සභාව සතුව නොමැතිවීම හේතුවෙන් සභාවට වෙන් කරන ලද පොදු ඉඩම් කොටස තහවුරු කර ගැනීම සඳහා මැනුම් කටයුතු සිදු කල නොහැකි තත්ත්වයක් පැවතුනි. | පෙදු කොටස් වල නිවැරදිතාවය තහවුරු කර මිණුම් කල යුතුය. | ඉදිරියේදී මහජන සුභ සිද්ධිය සඳහා යොදා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.5 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ටිපර් රථය , මාර්ග තලනය හා තල කම්පැක්ටරය අළුත්වැඩියා කලහැකි තත්ත්වයේ පැවතියද අළුත්වැඩියාවන් සිදු කර නොතිබුණි. | අළුත්වැඩියා කලහැකි තත්ත්වයේ පවතින වත්කම් අළුවැඩියා සිදුකල යුතුය. | ඉදිරියේදි අළුත්වැඩියා කිරිමට කටයුතු කරන බව දන්වමි. |

3.6 ප්‍රසම්පාදනය

---------------

ප්‍රසම්පාදනය සැලැස්ම

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා රු.මි. 5.5 ක් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කලද, ක්‍රියාත්මක කලයුතු ආකාරය පිළිබඳ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් හා කාල සටහනක් සකස් කර ඒ අනුව ප්‍රසම්පාදයන් සිදු කල යුතුය. | ඉදිරියේදි අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |

3.7 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| රණවිරු ප්‍රියන්ත ගුණසිංහ මාවත කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීමේදී මාර්ගයේ ගුණත්වය තහවුරු කිරිම සඳහා core පරික්ෂාවන් මගින් ලබා ගන්නා සාම්පල් මත පරික්ෂාවක් නොකර වෙන වෙනම පරික්ෂාවන් සිදු කර රු.86,656 ක් ගෙවීම් කර තිබුණි. | ඉදිකල මාර්ගයේ ගුණත්වය තහවුරු කිරීම සඳහා core testing මගින් සිදු කල යුතුය. | චක්‍ර ලේඛ ප්‍රකාරව අවශ්‍ය පරික්ෂාවන් සිදු කර ගෙවීම් සඳහා දිස්ත්‍රික් ඉංජිනේරු අනුමැතිය ලබා ඇති බව දන්වමි. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

-------------------------------------

නොවිසඳි ඇති විගණන ජේද

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| අගලවත්ත ප්‍රාදේශිය සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව පාලින්දනුවර ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු ශේෂය රු.7,782,632 ක් ලෙස දක්වා තිබුණ ද, පාලින්දනුවර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව , අගලවත්ත ප්‍රාදේශිය සභාවෙන් ලැබිය යුතු ශේෂය රු.5,931,815 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු. 1,850,817 ක වෙනසක් පැවතුනි. තවද, අගලවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව පාලින්දනුවර ප්‍රාදේශිය සභාවෙන් ලැබිය යුතු යැයි සටහන් කර ඇති රු.5,342,424 ක ශේෂයක් දක්නට ලැබුණ ද , පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශනවල එවැනි ශේෂයක් දක්වා නොතිබුණි. | සභා අතර ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. | ශේෂ නිරවුල් කිරිමට තීරණය කර ඇති බව දන්වමි. |